# සඤ්ඤා හෙවත් සංජානනය පිළිබඳ බෞද්ධ විග්‍රහය

(සුමේධ වීරවර්ධන, සහකාර කථිකාචාර්ය, දර්ශන හා මනෝවිද්‍යා අංශය,
පේරාදෙණි විශ්වවිද්‍යාලය.)

ඥානවිභාගය යනු දර්ශන විෂයේ ප්‍රධානතම උප විෂයය වේ. ඥානය පිළිබඳ විග්‍රහයක් බුදුසමයේ ද අන්තර්ගත වේ. ඥානය පිළිබඳ ව හෝ වෙනත් ඕනෑ ම සංකල්පයක් පිළිබඳ විග්‍රහයක් බුදුරජාණන් වහන්සේ විසින් කරනු ලැබ ඇත්නම් ඒ නිවන් අවබෝධය අරමුණු කර ගෙන ය. එසේ නොමැතිව හුදු විශ්ලේෂී අරුතකින් නොවේ.

සංජානනය හෙවත් සංඥා යන්නෙන් අදහස් කෙරෙන්නේ **'හඳුනා ගැනීම'** යි. සංයුක්ත නිකායේ, ඛජ්ජනීය සංයුක්තයේ, ඛජ්ජනීය සූත්‍රයේ දී බුදුරදුන් දේශනා කර ඇත්තේ සඤ්ඤා යනු හඳුනා ගැනීම බව ය. මජ්ඣිම නිකායේ, මහාවේදල්ල සූත්‍රයේ සඳහන් වන පරිදි, සඤ්ඤා යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් දැ යි මහා කොට්ඨිත හිමියන් විසින් සැරියුත් හිමියන්ගෙන් විමසූ විට උන්වහන්සේගේ පිළිතුරු දෙසූ ම පහත පරිදි විය. **''ඇවැත්නි' 'හඳුනා ගනී' 'හඳුනා ගනී' යන යම් හේතුයෙක් වේද එහෙයින් සඤ්ඤා යැයි කියනු ලැබේ. කුමක් හඳුනා ගන්නේ ද යත් නිල් වන ද හඳුනා ගනී. කසාවන ද හඳුනා ගනී, ලෙහෙවන් ද හඳුනා ගනී යන යම් හේතුවක් වේ ද එහෙයින් සඤ්ඤා යැයි කියනු ලැබේ'**. පංචස්කන්ධය අතරින් සඤ්ඤා ස්කන්ධය යනු මෙතෙක් අප විසින් කර ඇති හඳුනා ගැනීම් රාශිය බව පැහැදිලි ය.

සංයුක්ත නිකායේ, සත්තට්ඨාන සූත්‍රයට අනුව සඤ්ඤා, රූප සඤ්ඤා ශබ්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, ස්පර්ශ සඤ්ඤා යනුවෙන් සය ආකාර වේ. සඤ්ඤා යන්න නිතර ම යෙදී ඇත්තේ රූපාදී අරමුණු සමඟ න බැවින් මෙහිදී සංජානනය කෙරෙන්නේ 'අරමුණු' බව පැහැදිලි ය.

මජ්ඣිම නිකායේ, මහාහත්ථිපදෝපම සූත්‍රයට අනුව සඤ්ඤා හටගන්නේ වේදනාව ප්‍රත්‍ය කර ගෙන ය. මජ්ඣිම නිකායේ, මධුපිණ්ඩික සූත්‍රයේ දැක්වෙන **'යං වේදති තං සංජානාති'** (යමක් විඳියි ද එය හඳුනා ගනියි) යන පාඨයෙන් ද ඒබ ව තහවුරු වේ.

බුදුසමයට අනුව පුද්ගලයා යනු නාම, රූප හා විඤ්ඤාණ යන කොටස් තුනේ සමවායක් බව ජී.ඒ. සෝමරත්න ආචාර්ය තුමාගේ අදහස යි. මෙය බොහෝ තැන්වල හමුවන්නේ පුද්ගලයා යනු නාම - රූපවල එකතුවක් බව යි. මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රයට අනුව, වේදනා, සඤ්ඤා ඵස්ස හා මනසිකාර අයත් වන්නේ **'නාම'** කොටසට ය. ජී.ඒ. සෝමරත්න ආචාර්යතුමාට අනුව බුදුදහම මඟින් ප්‍රතිකර්ම ඉදිරිපත් කෙරෙන මූලික ගැටලුව, සම්බන්ධ වන්නේ රූපයට හෝ විඤ්ඤාණයට නොව **'නාම'** කොටසට ය. මෙම ප්‍රකාශයෙන් ගම්‍ය වන කරුණක් වන්නේ සඤ්ඤාකරණය හෙවත් සංජානනය නිවන් අවබෝධයට බාධාකාරී තත්ත්වයක් වන බව ය. එහෙත් එම අදහස පිළිගත හැකි ද යන්න විමසා බැලිය යුත්තකි.

සඤ්ඤා විපල්ලාසයන් හෙවත් අරමුණු, නිත්‍ය, සුඛ, ආත්ම සහ සුභ ආදී වශයෙන් හඳුනා ගැනීම හෙවත් සංජානනය කිරීම නිවන් අවබෝධයට බාධාවක් බව පැහැදිලි ය. මජ්ඣිම නිකායේ, මූලපරියාය සූත්‍රයේ දැක්වෙන පරිදි ආර්ය ධර්මයෙහි අදක්ෂ, ආර්යයන් නොදකින, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, අශ්‍රැතවත් පෘථග්ජනයා විසින් කෙරෙන්නේ පඨවිය, පඨවිය ආදී වශයෙන් මඤ්ඤණා කිරීම යි. හෙවත් පෘථිවිය පරම, නිත්‍ය, සුඛ, ආත්ම වශයෙන් හඳුනා ගැනීම යි. එම හඳුනා ගැනීම නිවන් අවබෝධයට බාධාවක් වන බව සැබෑ ය. එහෙත් සංජානනය කළ හැක්කේ, නිත්‍ය, සුඛ, ආත්ම ආදී වශයෙන් පමණක් නොවේ. රූපා දී අරමුණු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ ආදී වශයෙන් ද හඳුනා ගත හැකි ය; සංජානනය කළ හැකිය. අංගුත්තර නිකායේ ගිරිමානන්ද සූත්‍රයේ දැක්වෙන පරිදි ආනන්ද හිමියන් විසින් ගිරිමානන්ද හිමියන්ට දෙසුවේ දස සංඥාවන් වඩන ලෙස ය. එහි දැක්වෙන දස සංඥාවන් වන්නේ, අනිත්‍ය සඤ්ඤා අනාත්ම සඤ්ඤා, අසුභ සඤ්ඤා, ආදීනව සඤ්ඤා, ප්‍රහාණ සඤ්ඤා, විරාග සඤ්ඤා, නිරෝධ සඤ්ඤා, සියලු ලෝකයේ කලකිරීම් සහගත සඤ්ඤා, සියලු සංස්කාරකයන් හි අනිත්‍ය සඤ්ඤා සහ ආනාපාන සතිය යනාදිය වේ. ආනන්ද හිමියන් මේවා අසා දැන ගත්තේ බුදුරජාණන් වහන්සේගෙනි. මේ අනුව පැහැදිලි වන්නේ නිවන් අවබෝධ කිරීමේ මාර්ගයට පිළිපන් අයෙකු විසින් කළ යුතු **'හඳුනා ගැනීම්'** (සංජානන ද) ඇති බව ය. මේ අනුව අරමුණු නිත්‍ය, සුඛ ආදී වශයෙන් හඳුනා ගැනීම නිවන් අවබෝධයට බාධාවක් වුවත් අරමුණු, අනිත්‍ය, අනාත්ම වශයෙන් හඳුනා ගැනීම නිවන් අවබෝධයට උපකාරී වන බව පෙනේ.

සඤ්ඤා සම්බන්ධයෙන් දැනගත යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, වේදනා, සඤ්ඤා හා විඤ්ඤාණ යන ඒවා අතර වෙනසක් පැනවීම දුෂ්කර කාර්යයක් වන බව. ඊට හේතුව වන්නේ මේවා **'එක් වරම'** හට ගැනීම ය; හෙවත් පටිච්ච සමුප්පන්න වීම ය. මජ්ඣිම නිකායේ, මහාවේදල්ල සූත්‍රයට අනුව ඉහත කී සඤ්ඤා, විඤ්ඤාණ, වේදනා ආදිය අතර වෙනසක් පැනවිය අසීරු ය.

## ආශ්‍රිත මූලාශ්‍ර


1. **මජ්ඣිම නිකාය, ප්‍රථම භාගය,** (මජ්ඣිම නිකාය සංශෝධක මණ්ඩලයේ පරිවර්තනයකි.) ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි, කොළඹ, 2544/2545/2001, (දෙවන මුද්‍රණය), 689 පි.
2. **අංගුත්තර නිකාය, ෂෂ්ඨි භාගය,** (පරි. අංගුත්තර නිකාය සංශෝධක මණ්ඩලය), ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි, 2520/1977, 195 පි.
3. සෝමරත්න, ජී.ඒ. **නාම හා රූප ද? නාම - රූප හා විඤ්ඤාණ ද? සම්මුති** (2 - කාණ්ඩය) (සංස්, සෝමසිරි හිමි, තලන්ගල්ලේ සහ තවත් අය), සංස්කාරකවරුනගේ ප්‍රකාශනයකි, 2546/2002, 279 පි.


**(මෙම ලිපිය පාණදුරේ; වෑකඩ බෞද්ධ සහෝදර සමිතිය මඟින් ප්‍රකාශිත 'වෙසක් හඬ' (2550/2006) සඟරාවේ පළවිය.)**